# 1. හැඳින්වීම

පුවත්පත් කලා මාධ්‍ය පුළුල් පරාසයක් තුළ පැතිරී ගිය සුවිශේෂ ශිල්ප ක්‍රමයකි. එහි ආකර්ශනීයත්වයක් ද ඇත. ජනමාධ්‍ය අතර පුවත්පතට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. දීර්ඝ කාලයක් තුළ විකාශනය වෙමින් ආ පුවත්පත මිනිසා සමඟ පෙරට පැමිණ ඇත. මෙහි අර්ථය වන්නේ පුවත්පත මිනිසාට අවශ්‍ය වූ බවයි.

සෙසු ජනමාධ්‍යවලට වඩා වැඩි විශ්වාසයක් හා ළැදියාවක් සමාජය තුළ පුවත්පත සම්බන්ධයෙන් පවතී. ප්‍රකට ජනමාධ්‍ය විශාරද ප්‍රැන්සිස් විලියම්ස් මෙසේ පවසයි.

> **"තමන් ජීවත් වන යුගයේ සමාජ තත්ත්වය වෙනත් ඕනෑම ජනමාධ්‍යයකට වඩා පැහැදිලිව පුවත්පත පෙන්වා දෙයි. එය සමාජය නම් වූ දේශයේ වායු පීඩනය නිවැරදිව මැනීම සඳහා භාවිත කරන සුවිශේෂී වූ වායු පීඩන මානයක් බඳුය....."**
>
> (පෙරේරා. 2003, පි.12).

මිනිස් නෙතට හසුවන වස්තුවක් හෝ අවස්ථාවක් ඒ අයුරින්ම සනිටුහන් කර ගැනීමට මිනිසාට වූ අත්‍යවශ්‍යතාව අද ඊයෙක ඇති වූවක් නොවේ. එය ඉතිහාසයේ බොහෝ ඈතට දිව යන්නකි.

ජන සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ගත් කළ අද්‍යතන යුගයේ පුවත්පතට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. පුවත්පත් මාධ්‍යයට හිමි ආවේණික ලක්ෂණය වූ රූපය මගින් සමස්ත මානව සංහතිය වෙත එකම විටකදී දිය හැක්කේ ප්‍රබල පණිවිඩයකි. ප්‍රබල සන්නිවේදනයකි.

ඉතා පැරණි සමාජයේ සිටම තොරතුරු හුවමාරුව සිදු වූ අතර මෙය මිනිසාගේ අත්‍යවශ්‍ය වුවමනාවක් ලෙස ගොඩනැගෙන්නේ සමාජ සම්බන්ධතා වර්ධනය වීමත් සමඟයි. මුල් යුගයේ සංඥා භාවිතයත් පසුව කතා බහ තොරතුරු හුවමාරුව සඳහා යොදා ගැණින. මානවයා තුළ පවත්නා අත්‍යවශ්‍ය සන්නිවේදන වුවමනාවක් ලෙස ප්‍රවෘත්ති යන සංකල්පය වැඩෙන්නේ කාර්මීකරණයෙන් පසුවය. මිනිසාට පරිසරය, නිරීක්ෂණය කිරීමේ වුවමනාව තොරතුරු හුවමාරුව ඇති වීමට ප්‍රබලව බලපායි. මේ නිසා අද වන විට ප්‍රවෘත්තිවලට ඉහළ වටිනාකමක් ලැබී ඇත. මිනිසාගේ පැවැත්මේ සිට අද දක්වාම ප්‍රවෘත්ති අවශ්‍යතාවය රැඳී පැවතීම නිසා ප්‍රවෘත්ති යන තේරුම වඩා සංකීර්ණ වී ඇත.

ප්‍රවෘත්තියක් යනු කුමක්දැයි අධ්‍යයනය කිරීමේ දී ප්‍රවෘත්ති පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචන මගින් මෙය වඩාත් සනාථ කර ගත හැකිය. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ ප්‍රවෘත්ති පිළිබඳව සඳහන් කරන්නේ මෙසේය.

> **"Information about recent events. Broadcast Report news worthy information when a man bites a dog that's news"**
>
> (The Oxford English Dicticnary , 2nd Eidion).

මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර මූලස්ථානය කරගත් ආසියා ශාන්තිකර ගුවන් විදුලි

සංවර්ධන ආයතනය යුනෙස්කෝ මාධ්‍ය විශේෂඥයකු වූ පෝල්ඩ් මැසෙනියර්ගේ සම්පාදකත්වයෙන් පළ කළ "මෙන්න ප්‍රවෘත්ති" නැමැති අත් පොතෙහි ප්‍රවෘත්ති පිළිබඳව වඩා ප්‍රායෝගික අර්ථ කථනයක් ලබා දෙයි.

> "ප්‍රවෘත්ති යනු ජනතාවට බලපාන්නාවූත් ඔවුන් තුළ උනන්දුවක් ඇති කරවන්නාවූත් මෑත කාලීන හා වැදගත් සිදුවීමකට අදාළ අලුත් තොරතුරකි." (සමරනායක, 1998, පි.51).

මේ අනුව ජනමාධ්‍ය තුළ ප්‍රවෘත්ති සැළකෙන්නේ පූජනීය වස්තුවක් ලෙසයි.

මෙසේ බලන විට නූතන සන්නිවේදන මාධ්‍යයන් අතර මුද්‍රිත මාධ්‍යය ඉදිරියෙන් සිටී. දෘශ්‍ය සන්නිවේදන මාධ්‍යයක් ලෙස මුද්‍රිත මාධ්‍යයෙහි ඇති ප්‍රබලතාව, ජනප්‍රියතාව එම මාධ්‍යයෙහි ප්‍රවෘත්ති කෙරෙහි අවධානය වැඩි වශයෙන් යොමු වීමට හේතුවී ඇත. එසේම මුද්‍රිත මාධ්‍යයේ යම් පුවතක් වචනයෙන් ඉදිරිපත් කරන අතර එය රූපයෙන්ද ඉදිරිපත් කරයි. මේ අනුව මුද්‍රිත මාධ්‍ය ප්‍රවෘත්ති සන්නිවේදනය දෘශ්‍ය ලෙස දැකීමෙන් විශ්වාසනීයත්වයක් හා යථාර්ථයක් ඇති වන බව අද්‍යතන පිළිගැනීම වේ.

රූපය, වචනය අභිභවා මිනිසාගේ ඇස ආකර්ශනය කර ගැනීමට සමත් වන බව අවබෝධ කර ගැනීමෙන් පසු මුල් යුගයේ වචනවලට පමණක් සීමා වූ පුවත්පත් ප්‍රවෘත්ති වාර්තා පළ කිරීම්වලට රූප රාමු එක් කිරීමත් සමඟ වැඩි වටිනාකමක් හිමිවිය. මුලදී මේ සඳහා අතින් අඳින ලද චිත්‍ර භාවිත කළත්, සැබෑ සිදුවීමක් එලෙසින්ම වාර්තා කිරීමේ දී කාලය, විශ්වාසනීයත්වය හා යථාර්ථය යන්න චිත්‍රය තුළ බරපතල ගැටලු මතු කළ නිසා යථාර්ථය එලෙසින්ම වාර්තා කළ ඡායාරූපයට එම අවස්ථාව ලැබිණි.

මේ අනුව වචන හා ඡායාරූප අතර සබඳතාව නිසා එදිනෙදා පුවත්පත් කියවන පාඨකයාට ප්‍රවෘත්තියක් සම්පූර්ණයෙන්ම වටහා ගැනීමට අවකාශ සැලසිණි. පාඨක ග්‍රහණයට නතුවන සිදුවීමක් ඡායාරූපය නිසා ස්ථිරවම මනසේ තැන්පත් වූ අතර, එය අනෝන්‍ය සංවාදයට ද බඳුන්විය.

මෙබඳු හේතූන් නිසා හුදු වාර්තා කිරීම ඉක්මවා යමින් සන්නිවේදන ගුණයෙන් සහ කලාත්මක බවින් වඩා පිරිපුන් ඡායාරූප බිහි කිරීමට ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පීන්ට සිදු විය. ඒ අනුව බිහි කරන ලද ව්‍යක්ත ඡායාරූප හේතුවෙන් මුද්‍රිත මාධ්‍ය තුළ වඩා සුවිශේෂී බවක්, ප්‍රබල බවක් පාඨකයාට දැනෙන්නට වූ අතර, ඡායාරූප රහිත ප්‍රවෘත්ති විශේෂාංග, දැන්වීම් පාඨකයා ප්‍රතික්ෂේප කරන්නට විය. මෙලෙස ඡායාරූපය පුවත්පත් මාධ්‍යයට එක්වීමත් සමඟ ඊට නව ජවයක්, පෞරුෂත්වයක් එක්වූවා මෙන්ම ඡායාරූපමය පුවත්පත් කලාවක් වශයෙන් වර්ධනීය ක්ෂේත්‍රයක් ද බිහි විය.

මෙම තත්ත්වයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින්, ආලෝකයේ පතන දිශාව, ආලෝක තීව්‍රතාව, වර්ණ, උෂ්ණත්වය, නිවැරදි කැමරා කෝණයක් හා ගළපාගෙන "ප්‍රකෘතිය" සටහන් කර ගැනීමට සමත් විය.

ඡායාරූපයක් යනු,

**"සිද්ධියක නියම ස්වාභාවය දැක්වීමට උපකාරී වන සියුම් යථාර්ථවත් රූපකාරයත්, ඊට සමගාමීව එහි තීරණාත්මක මොහොතත් මැනවින් හඳුනාගෙන තත්පරයෙන් පංගුවක කාල පරාසයක් තුළ ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයකි."**

**- හෙන්රි කාර්ටියබ්‍රෙසොන් පවසයි.**

(ගුණසේකර, 2007, පි.9).

LIFE සඟරාව මගින් සුවිශේෂී ඡායාරූපමය සන්නිවේදනයක නියැළුණු ඇන්ඩ්‍රෑස් ෆිනින්ජර් ඡායාරූපයකින් කියැවෙන සංකල්පමය වටිනාකම් ගැන මෙසේ කියයි.

**" ඡායාරූපයක් ගැනීමේදී නිතරම මා උත්සාහ කරන්නේ එයට විෂය වූ අරමුණෙහි හෝ සිදුවීමෙහි මතුපිටින් පෙනෙන්නට තිබුණු දෙයට වැඩි යම්කිසි ගුණාංගයක් ඊට ඇතුළත් කිරීමටය. ....."** (ගුණසේකර, 2000, පි.128).

සන්නිවේදන කාර්යයේදී ප්‍රවෘත්ති ඡායාරූපයේ මතුවීම වර්තමානයේ වඩා ප්‍රබල තත්ත්වයට පත් ව තිබේ. පුවත්පත් කලා සම්ප්‍රදායේ පුරෝගාමී ජේසප් ජුලිස්ටර් දක්වනුයේ ප්‍රධාන අත්‍යවශ්‍ය අංගය වනුයේ නිවැරදි බව හා සෘජු බවය. සත්‍යය පූජනීයයි යන්න ප්‍රවෘත්ති ඡායාරූපයේ ප්‍රතිබිම්බය තුළ මතු කරනු ලබයි. ප්‍රවෘත්ති ඡායාරූපයේ පවත්නා වූ වටිනාකම් හේතු කොට ගෙන පුවත්පතේ පැවැත්ම වැඩි දියුණු වී තිබේ.

ඡායාරූපය පොදු භාෂාවකි. කලාවකි. අන් කවර සන්නිවේදන මෙවලමකටත් වඩා ඡායාරූපයෙහි ඇති නිරූපණාත්මක ශක්‍යතාවය හා සර්ව භාෂාත්මක අගය ඉතා ඉහළය. අධ්‍යාපනික, භූගෝලීය, වයස්, ස්ත්‍රී පුරුෂ ආදී වූ බොහෝ සීමාවන් ජය ගන්නා ප්‍රවෘත්ති ඡායාරූපය පුවත්පත් පිටුව තුළ මෑතකදී වඩා සන්නද්ධ තොරතුරු ප්‍රකාශන හැකියාවක් පෙන්නුම් කරයි. රූපයේ හා වචන අතර පවත්නා වඩා දියුණු ඌන පූරක සබඳතා, සංජානන ස්වරූප හා ඉන් ජනිත වන සංස්කෘතික ලක්ෂණ ද පෙන්නුම් කරයි. එපමණක් ද නොව ආකර්ෂණීය ලෙසත් පුවත්පතට බලපෑම් කරන ප්‍රවාත්ති ඡායාරූපය විටෙක සියල්ල අබිබව ගිය වටිනාකම් ද ජනිත කරවයි.

ඡායාරූපයක් පුවත්පත් පිටුවක ප්‍රතිනිර්මාණය කිරීමෙන් වචන සමූහයක් පුවත්පතෙහි මුද්‍රණය කළ විට ගොඩනැගෙන සන්නිවේදන ප්‍රතිඵලයට වඩා වෙනස් වූ අත්දැකීමක් ජනිත වේ. එහෙත් ප්‍රවෘත්තියක් ගැන කරුණු ඉදිරිපත් කිරීමේ දී කිවයුතු සියල්ලම ඡායාරූපයෙන්ම පමණක් ප්‍රකාශ කිරීම ද දුෂ්කර බව හැගේ. එවිට ඊට ආධාරක වශයෙන් වචනය ද යොදනු ලබයි. මෙහි අනෙක් පැත්ත ද මේ හා සමානය. යමක් කොපමණ වචන වැය කරමින් පැහැදිලි කළ ද එහි තත්ත්වය අවබෝධ කර දීමට දුෂ්කර වන අවස්ථා බොහෝය. එවිට භාෂාවේ සහාය පිණිස ඡායාරූපය ඉදිරිපත් කෙරේ.

සත්‍යය විකෘති නොවන ආකාරයෙන් ඉදිරිපත් කිරීම ප්‍රවෘත්ති සන්නිවේදනයේ මූලික ශික්ෂණය වන්නාසේම ඡායාරූප ප්‍රවෘත්ති කලාවේදී ද විකෘති හෝ සාවද්‍ය අරුත් ප්‍රකාශනයට ඉඩ නොලැබේ.

භාෂාමය ප්‍රවෘත්ති රචනාවක ඇති කල් ඉකුත්වීමේ ගුණය ප්‍රවෘත්ති ඡායාරූප වල දක්නට